## පානදුර නගර සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 14 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමි ශේෂය රු.13,263,170 ක් වුවත්, රු.16,163,055 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ණයහිමි ශේෂය රු.2,899,885 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන ආයතනවල ගිණුම් තැබීමේ පරිපාටියට අනුව ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම ගිණුම් දෙක අතර රු.932,764 ක වෙනසක් තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු වූ රු.1,780,482 ක මුදල සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා මාර්ග ඉදිකිරීමක් සඳහා දරන ලද රු.282,371 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඉ) දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය මත ලබාගත් බැකෝ ලෝඩරය ගිණුම්ගත කිරීමේදී එකී ණය වෙනුවෙන් ගෙවන ලද රු.2,140,772 ක් වූ පොලියද ඇතුළත්ව ප්‍රාග්ධන ගත කර තිබීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම්වල ශේෂ රු.2,140,772 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2013, 2014 වර්ෂවලට අදාලව ලැබුණු රු.47,025,421 ක් වූ මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු.60,395,961 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදයම රු. 31,428,682 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.28,967,279 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු. 28,967,279 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.53,590,950 කින් වැඩිවීම හා වියදම් රු.24,623,671 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 43,994 | 29,156 | 23,564 |
| (ii) බදු කුලී | 3,528 | 3,404 | 593 |
| (iii) බලපත්‍ර ගාස්තු | 364 | 356 | 08 |
| (v) වෙනත් ආදායම් | 36 | 36 | -- |

2.2.2 **වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.25,196,795 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.14,764,572 ක් හෙවත් සියයට 59 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බදු බිල් කිරීම රු.40,888,525 ක් වූ අතර වර්ෂය තුළ ඉන් රු.26,182,574 ක් හෙවත් සියයට 64 ක් අයකරගෙන තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 වන විට අයවිය යුතු වරිපනම් ශේෂය රු.23,350,372 ක් වූ අතර ඉන් වර්ෂ 3 ඉක්ම වූ හිඟය රු.1,975,529 ක් හා වර්ෂ 5 ඉක්ම වූ හිඟය රු.4,449,561 ක් විය. මේ අනුව හිඟ වරිපනම් අයකරගැනීමේ දුර්වලතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) ඉහත හිඟ හිටි වරිපනම් ශේෂය තුළ රු.50,000 ට වැඩි වරිපනම් ඒකක 52 ක් විය.

2.2.3 **වෙළඳ ස්ථාන කුලී**

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.708,687 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළ හිඟයෙන් රු.238,877 ක් හෙවත් සියයට 34 ක් අයකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා බිල් කිරීම රු.3,261,124 ක් වූ අතර ඉන් රු.3,137,647 ක් හෙවත් සියයට 96 ක් අයකරගෙන තිබුණි.

2.2.4 **ත්‍රිරෝද රථ නැවතුම්පල ගාස්තු**

2015 ජනවාරි 29 දිනැති මහා සභා තීරණ අංක 6:1:14 මගින් ත්‍රිරෝද රථ නැවතුම් බලපත්‍ර ගාස්තු ලෙස එක් ත්‍රිරෝද රථයකින් වර්ෂයකට රු.1,000 බැගින් අයකිරීමට තීරණය කර අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද, 2016 වර්ෂය සඳහා නගර සභා බල ප්‍රදේශය තුළ තිබෙන ත්‍රීරෝද රථ නැවතුම්පලවල් 67 ක් අතුරින් 42 කින් කිසිදු ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. තවද, මෙම රථගාල්වල පවතින ත්‍රීරෝද රථ පිළිබඳ සමීක්ෂණයක් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>දැන්වීම් පුවරු ආදායම</u>

(අ) 2016 වර්ෂයට දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබූ බැවින් සභාවට ලැබිය යුතු දැන්වීම් පුවරු ආදායම පිළිබඳ තක්සේරුවක් කිරීමට නොහැකි විය.

(ආ) විගණනයෙන් හඳුනාගන්නා ලද දැන්වීම් පුවරු 11 කින් අය විය යුතු රු.368,875 ක් වූ ආදායම් අයකර නොගෙන එම දැන්වීම් පුවරු කපා ඉවත්කර ඇති බව දන්වා තිබුණි.

2.2.6 <u>මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. 78,189,060 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) <u>වාහන පාලනය</u>

<u>ධාවනය නොවන වාහන</u>

අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන බව අදාල නියෝජිත ආයතනය දැනුම් දී තිබූ රථයක් අළුත්වැඩියා කිරීමෙන් මාස පහකට පසු නැවත ක්‍රියා විරහිත වී තිබුණි. එකී රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයට රු.76,070 ක් ගෙවා තිබූ අතර අළුත්වැඩියා කිරීමෙන් පසු වාහනය ධාවනයෙන්ද ඉවත් කර තිබුණි.

(ආ) <u>කසළ බැහැර කිරිම සඳහා පෞද්ගලික ආයතනයකට මුදල් ගෙවීම</u>

නගර සභා බල ප්‍රදේශයේ කසළ බැහැර කිරිම සඳහා ලංසු කැඳවා පුද්ගලික ආයතනයකට පවරා තිබූ අතර 2016 වර්ෂයේ කසළ ලෝඩ් 1479 කට රු.31,059,000 ක් සභාව විසින් ගෙවා තිබුණි. මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබූ අතර ප්‍රසම්පාදන කමිටුව, ලෝඩ් එකකට (කියුබ් 3) රු.17,570 ක් වූ අවම මිල ඉදිරිපත් කර තිබූ සුපර් කොම්පෝස්ට් සමාගම නොසලකා රු.21,000 ක් වූ වැඩිම මිල ඉදිරිපත් කර තිබූ G.F.C. මැෂිනරි (පුද්.) සමාගම තෝරාගැනීම නිසා රු.5,072,970 ක පාඩුවක් සභා

අරමුදලට සිදු වී තිබුණි. තවද, කසළ බැහැර කිරීමේදී නිසි අධීක්ෂණයක් සිදු නොකිරීම, මාසිකව ඉවත් කළ කසළ ලෝඩ් ප්‍රමාණය 88 සිට 156 දක්වා එකිනෙකට නොසැසඳෙන අසාමාන්‍ය තත්ත්වයක් පෙන්නුම් කිරීම, කසළ බැහැර කරන ස්ථානයට පරිසර බලපත්‍රයක් නොමැති වීම, 2010 වර්ෂයේදී ඉදි කළ ජීව වායු ඒකකය ක්‍රියාත්මක නොකිරීම සහ සභා බල ප්‍රදේශය තුළ එකතු වන කසළවලින් පොහොර නිපදවීම වැනි ක්‍රමවත් වැඩ පිළිවෙලක් හඳුන්වා දීම වැනි කරුණු නොසලකා සභාව විසින් වේයන්ගොඩ වැනි දුර බැහැර ප්‍රදේශයකට කසල බැහැර කර තිබුණි.

(ඈ) <u>පොදු වෙළඳපොල සංකීර්ණ ගොඩනැගිල්ල අනතුරුදායක තත්ත්වයකට පත්වී තිබීම</u>

1993 සහ 1994 වර්ෂවලදී වර්ග අඩි 25830 ක විශාලත්වයකින් යුතුව මහල් දෙකක් සඳහා සැලසුම් කර, එක් මහලක් පමණක් සාදා නිම කරනලද මෙම වෙළඳ සංකීර්ණය ඇතුළත කඩ කාමර 250 කින් හා පිටත කඩකාමර 70 කින් සමන්විත වේ. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් 2016 අගෝස්තු 24 දින ලබාදෙන ලද වාර්තාව අනුව මෙම ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් ව්‍යුහය දිරාපත් වී ඇති නිසා භාවිතා කරන්නන්ට අනතුරුදායක තත්ත්වයක් ඇති විය හැකි බැවින් එය කඩා ඉවත් කළ යුතු බවත් දන්වා තිබුණි. මේ සම්බන්ධව සභාව විසින් කඩහිමියන් දැනුවත් කර 2016 දෙසැම්බර් අවසන් වන විට ඉවත්වන ලෙස දන්වා තිබුණද, කඩහිමියන් වෙළඳසැල් පවත්වාගෙන යමින් තිබුණි. මෙසේ අනතුරුදායක ගොඩනැගිල්ලක වෙළඳසැල් පවත්වාගෙන යාමෙන් වෙළඳුන්ට හා එහි පැමිණෙන මහජනතාවට කුමන හෝ අවස්ථාවක විශාල විනාශයක් සිදුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ. තවද, මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් 2017 ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා රු.79,485 ක විදුලි බිලක් ගෙවා තිබූ අතර තවදුරටත් ජලය හා විදුලිය වෙනුවෙන් රු.114,440 ක බිල්පත් ලැබී තිබුණි.

(ඇ) <u>ඉඩම් ගොඩනැගිලි පරීක්ෂාව</u>

යාවත්කාලීන නොකරන ලද ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් හා ඇතුළත් නොවූ ඉඩම් 45 ට අදාලව ප්‍රකාශන ඔප්පු 2 ක් පමණක් සභාව සතුව පැවති අතර සභාව සතු ඉඩම් පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව සභාවට අයත් සමහර ඉඩම් කොටස් වෙන් කර හඳුනාගත නොහැකි විය. තවද, පුද්ගලයින් අනවසරයෙන් පදිංචිව ඇති අවස්ථා

නිරීක්ෂණය වූ අතර පුද්ගලයින් වෙත සින්නක්කර ඔප්පු මගින් අයිතිය ලබාදී තිබූ ඉඩම් සභාවේ වත්කම් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබූ අවස්ථාද නිරීක්ෂණය විය.

4. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) කසළ කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) අයවැය පාලනය